**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 23 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

**(අ) දේපල පිරියත හා උපකරණ**

-----------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.548,611,863 ක් වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු. 550,334,614 ක් වූයෙන් එම ශේෂයෙහි රු.1,722,751 ක වෙනසක් පෙන්නුම් කර ඇති අතර එම වෙනසට හේතුව සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයට 2104 වැය විෂයය යටතේ අතිරේක ප්‍රතිපාදන රු.1,722,752 ක් වැය කර මීගමුව කාර්යාලය අළුත්වැඩියා කල බිල්පතක් ගෙවූ අතර, එම වියදම භාණ්ඩගාර මුද්‍රිත සටහනේ ගොඩනැගිලිවල ආරම්භක ශේෂයට එකතු කර ඇත. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ සමඟ වෙනස්වීමට හේතුව සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ii) | ධාවන තත්ත්වයේ පවතින වාහන 02 ක තක්සේරු වටිනාකම වූ රු.7,800,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වාහන 02 හිම 2022 වර්ෂයට අදාලව නව තක්සේරු වටිනාකම ලැබුණු පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | ධාවන තත්ත්වයේ පවතින වාහනවල තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දැක්විය යුතු අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම රු.104,663,433 ක් වුවද, එය රු. 88,761,535 ක් ලෙස දක්වා තිබුණි. | වෙනත් ආදායම් ශීර්ෂ සඳහා එකතු කරන ලද අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සටහන් නොකරන ලෙස උපදෙස් දී ඇති බැවින් එම අගය අග්‍රිම ගිණුමෙහි අනෙකුත් ආදායම් ශීර්ෂ මඟින් එකතු කරන ලද ආදායම යටතේ දක්වා ඇත . | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි, නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතු වේ. |
| (ii) | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද රු.507,265 ක වියදම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | (i) 151-2-3-(65)-2506,(71) , (73) සහ (74) වැය විෂයයෙන් වෙන්කල රු.275,000 ක ප්‍රතිපාදනය ධීවර අමාත්‍යාංශ වැය | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.10 වගන්තිය ප්‍රකාරව කටයුතු |

| | | |
|---|---|---|
| | විෂයයෙන් හරස් සටහන් මඟින් ලබාගත් බලපත්‍ර ගාස්තු ආදායමකි.<br><br>(ii) 253-1-2 -4-1502 - රු.590,932 ක මුදල විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගත් අත්තිකාරම් " බී" ගිණුමට අදාළ හරස් සටහන් කොටසක් වේ .<br><br>(iii) 130 - 1 - 2 -0- 1003 - රු.358,666, 2021 වර්ෂයේ බඳවාගත් අභ්‍යාසලාභි උපාධිධාරීන් ට පුහුණු කාලසීමාව තුළදී ඔවුන් පුහුණුව සඳහා අනුයුක්ත කරන ලද කාර්යාල මඟින් ගෙවනු ලැබූ දීමනා, සේවය ස්ථිර කල පසුව වැටුප් ගෙවීමේදි අයකරගත් දීමනා 291-1-1-0-1003 වැය විෂයයට හර කර 130-1-2-0-1003 වැය විෂයයට බැර කිරීමයි. එම වියදම 291-1-1-0-1003 වැය විෂයය යටතේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා ඇත. එමෙන්ම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ හරස් සටහන් මඟින් ගෙවීම් යටතේ ද එම අගය දක්වා ඇත. | කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 1401 (ප්‍රවාහන) වැය විෂය සඳහා වූ රු.3,800,000 ක අයවැයගත ප්‍රතිපාදනයෙන් රු.2,150,000 ක් ඉතිරි වී තිබුණු | මෙම වැය විෂයයෙන් මාණ්ඩලික නිලධාරින් සඳහා ප්‍රවාහන දීමනාව හැරුණු කොට භාණ්ඩ ප්‍රවාහනය සිදු කරන අතර, පසුගිය වර්ෂයේ රට තුල | ප්‍රතිපාදන මාරු කිරීමට පිළිගත හැකි හේතු ඉදිරිපත් කළ |

| | | |
|---|---|---|
| අතර ඉන් රු.2,000,000 ක්, එනම් මුල් අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 52.6 ක් පිළිවෙලින් වැය විෂයය අංක 1404 (බදු සහ පළාත් පාලන ආයතන බදු) සඳහා රු.800,000 ක් ද, වැය විෂය අංක 1409 (වෙනත් සේවා) සඳහා රු.1,200,000 ක් ද වශයෙන් මාරු කර තිබුණි. එලෙස ප්‍රතිපාදන මාරු කිරීමට ඉදිරිපත් කර තිබූ හේතුව ලෙස රථ වාහන දීමනා හිමි නිලධාරීන් ස්ථාන මාරුවීම් ලෙස සඳහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන දීමනා ගෙවීම් පිළිබඳ පරික්ෂාවේදී එම හේතුව පිළිගත හැකි බවට සනාථ නොවුණි. | පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සීමිත කාර්ය මණ්ඩල ප්‍රමාණයක් කැඳවීම සිදුකල බැවින් ඔවුන් හට ප්‍රවාහන පහසුකම් ද සැපයීම නිසා නිලධාරීන් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ද ප්‍රතිපාදන වෙන් කරන ලදි . එසේ වුවත් වසංගත තත්ත්වය පැවති කාලයේ සංචරණ සීමා කිරීම් නිසා ප්‍රවාහන පහසුකම් සැපයීම නොකරන ලද අතර වියදම් සීමා කිරීම හේතුවෙන් මිලදී ගැනීම් ද සීමා වූ බැවින් භාණ්ඩ ප්‍රවාහන වියදම් ද සීමා වූ බැවින් ඉහත ඉතිරිවීම් ඇති වී තිබුණි. | යුතුය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) හි විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුල් ප්‍රතිපාදන ඇත්නම් විනා සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වූ නමුත්, අංක 1101 (දේශීය ගමන් වියදම්) දරන වැය විෂයය සඳහා ප්‍රතිපාදන නොතිබියදී රු.1,332,911 ක බැරකම්වලට එළඹ තිබුණි. | අත්‍යාවශ්‍ය රාජකාරි අවස්ථාවන් වැඩිවීම හේතුවෙන් එවැනි අවස්ථා සඳහා නිලධාරීන් වැඩි ප්‍රමාණයක් රාජකාරි කටයුතු වල යෙදීමට සිදුවිය . සැලසුම් සහගත නොවූ මෙවැනි හදිසි අවස්ථාවන් ඇතිවූ බැවින් 1101 - දේශීය ගමන් වියදම් වැය විෂයය සඳහා බැඳීම් ඇති කරගැනීමට සිදුවී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අංක 1409 (වෙනත් සේවා) වැය විෂයයට අයත් වන රු.7,604,211 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් තුළ, ධීවර අමාත්‍යාංශය වෙත 2018, 2019 සහ 2020 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.5,713,421 ක ආරක්ෂක සේවා මුදලක් ද 2019 හා 2020 වර්ෂ | වෙනත් සේවා වැය විෂයය සඳහා එක් එක් වර්ෂයට ලබාදෙන ප්‍රතිපාදන තුල ධීවර අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය කල යුතු වියදම් ගෙවා අවසන් කල නොහැකි වන අතර දිගින් දිගටම අතිරේක ප්‍රතිපාදන ඉල්ලීම් කල ද අතිරේක ප්‍රතිපාදන නොලැබූ බැවින් මෙම අගය පවතී. | පෙර වර්ෂවල බැරකම් කඩිනමින් නිරාකරණය කළ කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් ගෙවිය යුතු රු.1,890,790 ක සනීපාරක්ෂක සේවා වියදමක්ද ඇතුළත් කර තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,570,041 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | සිගාස් (Cigas) වැඩසටහනෙහි 2022 ජනවාරි 11 දක්වා වියදම් පමණක් ඇතුළත්ව ඇති බැවින් 2022 වර්ෂයට අදාල බැරකම්වලින් කොටසක් ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. | සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධිත පනතෙහි 31(4) වගන්තිය | 1,984,556 | 2015 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා රු.2,539,683 ක් වියදම් කර තිබුණු නමුත් එම මුදලින් දෙපාර්තමේන්තුව වෙත අයකර ගතයුතු රු.1,984,556 ක මුදලක් මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර, | 2015 සිට 2021 දක්වා කාලය තුළ අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා වියදම් වූ මුදලින් රු.555,127 ක් නැවත අයකර ගෙන ඇති අතර අයවීමට ඇති ඉතිරි මුදල් අයකරගැනීම සඳහා නීති මඟින් කටයුතු කිරීම ආරම්භ කර ඇත . | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා දරන ලද වියදම් පනත ප්‍රකාරව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අයකර ගතයුතු මුදල් වටිනාකම දරන ලද මුළු වියදමින් සියයට 78.1 ක් වී තිබුණි. | | |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.3.1 (අ) වගන්තිය | - | ප්‍රසම්පාදනයට සූදානම් වීමේ කටයුතුවල වියදම් සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු සිදුවන කටයුතුවල වියදම්, මුළු පිරිවැය ඇස්තමේන්තුවේ වෙන් වශයෙන් සඳහන් කළ යුතු වුවද ලංසු කැඳවීම වෙනුවෙන් සිදු කරනු ලබන පුවත්පත් දැන්වීම් වියදම්, මුළු පිරිවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රථම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළමු අත්තිකාරම වූ රු.25,000 පියවා නොතිබියදී දෙවන අත්තිකාරම වූ රු.100,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී එකම නිලධාරියෙක් වෙත අවස්ථා දෙකකදී ලබාදී තිබුණු අතර එම මුදලින් කිසිදු උපයෝජනයක් සිදු නොකර මාස 04 ක් සහ මාස එකහමාරක කාල පරාසයක් ගත වීමෙන් පසුව නැවත පියවා තිබුණි. එලෙසම රු.30,000 ක අත්තිකාරම් මුදලක් ලබාගත් නිලධාරියෙකුද එම මුදලින් කිසිදු උපයෝජනයක් සිදු නොකර මාස 08 ක කාලයක් ගතවීමෙන් පසුව නැවත පියවා තිබුණි. | රාජකාරි අවශ්‍යතාවය මත එම නිලධාරියා වෙනත් අංශයකට අනුයුක්ත කිරීම මත මෙලෙස ලබාගත් අත්තිකාරම් භාවිතයට නොගෙන මුදලින් ගෙවීමට කටයුතු කර ඇත. | අත්තිකාරම් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් 2,341 කින් ඉවත් කිරීමට යෝජිත අනවසර ඉදිකිරීම් 1,721 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට කඩා ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2,074 කින් කඩා ඉවත් කළ සංඛ්‍යාව 446 ක් වූ අතර, එය කඩා ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් සංඛ්‍යාවෙන් සියයට 21.5 ක් වී තිබුණි. | අනවසර ඉදිකිරීම් දිවයින පුරා විසිරී පවතින බැවින් එක් ස්ථානයක පමණක් ඇති අනවසර ඉදිකිරීමක් ඉවත් කිරීමට යාමේ දී විශාල පිරිවැයක් මෙන්ම දැඩි මහජන විරෝධතාවයන් සිදු වීම, කොවිඩ් වසංගත තත්ත්වය. ඉවත් කිරීම් වෙනුවෙන් නව විකල්ප ස්ථාන ලබා දීමේ හැකියාව නොමැති වීම,මහජන නියෝජිතයන්ගෙන් ඇතිවන බලපෑම් සහ ඉවත් කිරීම් සිදු කිරීමට සහභාගි වන නිලධාරීන්ට සහ ඒ සඳහා සහය ලබාගන්නා පුද්ගලයින් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා නොදීම, යනාදිය හේතුවෙන් එම ඉවත් කිරීම් සිදු කිරීමට නොහැකි වුණි. | අනවසර ඉදිකිරීම් පාලනය කිරීම සම්බන්ධයෙන් විකල්ප විසඳුම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 වර්ෂයේ කළුතර කැලිඩෝ වෙරළේ මීටර් 400 ක් දිග රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 58 කින් 2021 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 22 ක් වී තිබුණු අතර එදිනට සියයට 33 ක භෞතික ප්‍රගතියක් පමණක් පෙන්නුම් කෙරුණි. | යෝජිත ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍යවලින් වැඩි ප්‍රමාණයක් සැපයුම කර ගන්නා ලද අතර එම වර්ෂය තුළ ගෙවීම් සිදුකර නොමැත. එහි අදියර II වැඩබිමෙහි මීටර් 135 ක පමණක් වැඩ අවසාන කරන ලදි. ඒ අනුව පැති බැම්ම ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් ලෙස දැක්විය හැක. | ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලුනාව මීටර් 500 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 25 කින් 2021 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 16.1 ක් වී තිබුණු අතර එදිනට සියයට 25 ක භෞතික ප්‍රගතියක් පමණක් පෙන්නුම් කෙරුණි. | වැඩබිම ආරම්භ කරන විට බැම්ම ප්‍රතිසංස්කරණයට ප්‍රවේශ මාර්ගයක් සාදා ගැනීමට කාලයක් ගත වීම, ඉදිකිරීම් ස්ථානයට පිවිසීමට තාවකාලික දුම්රිය හරස් මාර්ගයක් සාදා ගැනීමට කාලයක් ගත වීම, වෙළඳපොලේ ඉන්ධන මිල හා ඒ ආශ්‍රිත අනෙකුත් ද්‍රව්‍ය මිල ඉහල යාම නිසා ද්‍රව්‍ය සැපයුම්කරු ද්‍රව්‍ය සැපයීම සඳහා ඒකකයක මිල වැඩි කිරීමට ඉල්ලීම් කිරීම නිසා නැවත ද්‍රව්‍ය සැපයුම්කරුවන් ප්‍රසම්පාදනය කර තෝරා ගැනීමට සිදු වීම නිසා බැම්මේ ප්‍රතිසංස්කරණ ප්‍රගතිය අඩු වී ඇත. | ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |
| (ඇ) | මුතුපන්තිය උතුර මීටර් 115 ක රිවට්මන්ට් බැම්ම දීර්ඝ කිරීම වෙනුවෙන් රු.මිලියන 11 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය යන්ත්‍ර සපයා ගැනීමට නොහැකිවීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 5.7 ක් වී තිබුණු අතර එදින වන විට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | සපයා ගැනීමට අවශ්‍ය යන්ත්‍ර ලබා ගැනීම සඳහා සැපයුම්කරුවෙකු ඉදිරිපත් නොවුණු බැවින් ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා පමණක් එම වර්ෂයේ ගෙවීම් සිදුකර ඇත. ඒ අනුව ද්‍රව්‍ය සැපයුම සඳහා මිලියන **5.3**ක් වියදම් කර ඇත. ඉදිකිරීම් යන්ත්‍ර ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඒ සඳහා වූ ප්‍රතිපාදන මිලියන 5.7 වියදම් කර ගත නොහැකි විය. | ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ හදිසි වෙරළ සංරක්ෂණ වැඩ යටතට ඇතුළත් කර තිබූ පහළ කටුනේරිය බැංකඩ හන්දියේ මීටර් 250 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.56,979 ක වියදමක් දරා ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි. | නිරිත දිග මෝසම් කාලයේදී ඇති වූ මෙම හදිසි වෙරළ ඛාදන තත්වය පසුව සමනය වීම නිසා ඉදිකිරීමේ අවශ්‍යතාව ද නොමැති විය. ඉදිරියේදී අවශ්‍යතාවයක් ඇති වුවහොත් මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලැබේ. | හදිසි වෙරළ සංරක්ෂණ වැඩ පිළිබඳව නිශ්චිත හඳුනාගැනීම් සිදු කළ යුතුය. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව සෑම අස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව ද එවීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | හු සළු අවශ්‍යතාවයන් නිවැරදි කාලයේ හඳුනා නොගැනීමත්, අවම තොග මට්ටම් පවත්වාගෙන නොයාමත්, යලි ඇණවුම් මට්ටම් නිවැරදිව හඳුනා නොගැනීමත් හේතුවෙන් හදිසි මිලදී ගැනීම් නිසා මිල ගණන් ඉදිරිපත් කළ එකම ආයතනයෙන් හු සළු මිලට ගැනීමට සිදු වී ඇති අතර හදිසි මිලට ගැනීම් යටතේ 2020 දෙසැම්බර් 10 දින වර්ග මීටරයක් සඳහා රු.597.38 ක් වැය කොට තිබුණි. 2021 පෙබරවාරි 18 දින එළඹි ගිවිසුම අනුව සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ හු සළු වර්ග මීටරයක් රු. 382.70 ක් යටතේ මිලදී ගැනීමට හැකි වී තිබූ අතර දෙපාර්තමේන්තුව හු සළු වර්ග මීටර් 2,320 ක් හදිසි මිලදී ගැනීම් යටතේ ප්‍රසම්පාදනය | 2020 වර්ෂයේ භාවිතා කරන ලද්දේ 2019 වර්ෂයේ මිලදී ගත් හු සළු තොගයේ ඉතිරිව තිබූ ප්‍රමාණයකි. හු සළු 40,000m³ මිලදී ගනු ලැබුවේ විදේශ වෙළඳපොළ හරහා දේශීය නියෝජිත ආයතනයක් මඟින් තොග වශයෙන් සැපයීම මඟිනි. එසේ විශාල ප්‍රමාණයක් එකවර මිලදී ගැනීමේදී එක් වර්ග මීටරයක් සඳහා වන වියදම සාමාන්‍යයෙන් අවම වේ. හදිසි මිලදී ගැනීම් සිදුකරන අවස්ථා වලදී දේශීය වෙළඳපොලේ තිබෙන හු සළු මිලදී ගන්නා අතර එවිට ලබා දෙන්නේ දේශීය ආයතනය මඟින් ආනයනය කරන ලද හු සළු වේ. හදිසි මිලදී ගැනීම් වලදී අවම අවශ්‍යතාවය මත මිලදී ගනු ලබයි. ආනයනය කරන ලද හු සළු හේතුවෙන් ඩොලරයේ අගයේ වෙනස්වීම, පවතින ඩොලරයේ අගයේ වටිනාකම හා ඔහුගේ ලාභය, දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය හා ප්‍රමාණය ආදිය හේතුවෙන්ද මෙම | යලි ඇණවුම් මට්ටම් නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම හේතුවෙන්, වර්ග මීටරයකට රු.214.68 බැගින් රු.498,058 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගෙවන ලද මුදල වැඩි වී ඇත. | |
| (ආ) | මු.රෙ.137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව වවුචරය අනුමත කරන නිලධාරියා වගකිව යුතු නමුත් ලී බඩු, දෙපාර්තමේන්තුව වෙත සම්පූර්ණයෙන් ලැබී නොතිබියදී 2020 දෙසැම්බර් 31 දින ලී බඩු මිලදී ගැනීම වෙනුවෙන් ලියන ලද රු.485,255 ක් වූ චෙක්පත මාස 10 කට වඩා කාලයක් ගත වීමෙන් පසුව සැපයූ භාණ්ඩවලට පමණක් රු. 179,830 ක් ගෙවා 2021 නොවැම්බර් 03 දින ඉතිරි මුදල වූ රු.305,424 ක් පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. | රටේ පැවති තත්ත්ව හමුවේ සැපයුම්කරුට ඇණවුම සම්පූර්ණ කල නොහැකි වූ අතර සැපයූ භාණ්ඩවලට පමණක් රු. 179,831 ක් ගෙවීම් සිදුකර ඉතිරි මුදල වන රු.305,424 රජයේ ආදායමට බැර කරන ලදී. | ප්‍රසම්පාදන සම්බන්ධ ගෙවීම් කටයුතු මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | -------------- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 04 කට අයත් ඉඩම් හා ගොඩනැගිලිද, යන්ත්‍ර 04 ක, වාහන 06 ක සහ යතුරු පැදි 08 කද වටිනාකම, 2021 දෙසැම්බර් 31 දින වන | ඒ සඳහා කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුව සතු මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 04 කට අයත් රු.103,675,000 ක් වටිනාකමැති ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රාදේශීය කාර්යාල 02 කට අයත් වටිනාකම තක්සේරු කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි 2021 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒ සඳහා කටයුතු කරමින් පවතී. | වත්කම් පවරා ගැනීම කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 02 ක් ස්ථාපිත කර ඇති ඉඩම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මගින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉඩම් ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණු නමුත් ඉඩම් පැවරුම් සහතික ලැබී නොතිබුණි. | ඒ සඳහා කටයුතු කරමින් පවතී. | ඉඩම් පැවරුම් සහතික කඩිනමින් ලබා ගත යුතුය. |
| (ඈ) | වර්ෂ 16 කට සහ වර්ෂ 09 කට පෙර ව්‍යාපෘතිවලින් ලද යතුරු පැදි දෙකක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියෙන් ලද යතුරු පැදි 02 පවරාගැනීමටත් ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව දන්වා තිබුණි. | පවරා ගැනීම කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඉ) | මොරටුව ප්‍රාදේශීය කාර්යාලයට අදාලව 2021 මාර්තු 01 දින සිදු කරන ලද 2020 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, විකිණිය යුතු භාණ්ඩ වර්ග 29 ක් ද, විනාශ කොට දැමිය යුතු භාණ්ඩ වර්ග 05 ක් ද, ප්‍රතිසංස්කරණය කළ යුතු භාණ්ඩ වර්ග 01 ක් ද හඳුනාගෙන තිබුණි. නමුත් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ද ඇතුළත්ව 2022 වර්ෂයේදී මෙම අපහරණ කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාල නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලීය ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.6,722,465 ක් වැය කර තිබුණු අතර, එහි දෙවන මහළ නිල නිවාසයක් ලෙස භාවිතා කිරීමට සැලසුම් කර තිබුණ ද එම නිල නිවාසය භාවිතයට ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ලේ දෙවන මහල ප්‍රාදේශීය ඉංජිනේරු නිල නිවාසය අවශ්‍යතාවය මත දෙපාර්තමේන්තු නිළධාරීන්ට නවාතැන් ගත හැකිවන පරිදි නේවාසික පහසුකම් සහිතව කොටස් දෙකකින් සමන්විතවේ. මේ සඳහා අවශ්‍ය ගෘහ උපකරණ, අවශ්‍යතාවය මත පවතින ප්‍රතිපාදන සීමාවන් නොඉක්මන පරිදි සපයා දීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | උපරිම කාර්යක්ෂමතාවය කින් යුක්තව වත්කම් උපයෝජනය කළ යුතුය. |
| (උ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2020 දෙසැම්බර් 31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත්, වටිනාකම තක්සේරු කර නොමැති හා ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති කෲ කැබ් එකක් සහ ටිපර් 04 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කර නොතිබුණි. තවද දෙපාර්තමේන්තුව සතු රු.11,900,000 ක් වූ එක්ස්කැවේටර් යන්ත්‍රයක් 2019 සැප්තැම්බර් මාසයේ සිට ධාවන තත්ත්වයේ නොපැවති අතර, වටිනාකම තක්සේරු කර නොමැති තවත් යන්ත්‍ර 02 ක් 2018 ඔක්තෝබර් මස සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණු නමුත් එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණ කිරිම සඳහා කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.7 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 ජුනි 23 දින සිට 2022 ජුනි 22 දින දක්වා වූ පස් අවුරුදු කාල සීමාවක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වෑන් රථයක් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු.10,416,515 ක කල්බදු මුදලක් ගෙවා තිබුණු අතර, ගතවූ අවුරුදු 04 මාස 06 ක කාල පරිච්ඡේදය තුළ ධාවනය කළයුතු අවම දුර ප්‍රමාණය කිලෝ මීටර් 162,000 ක් වුවද එම රථය ධාවනය කර තිබුණු මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර් 91,132 ක් පමණක් වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමකින් තොරව මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගත් වෑන් රථයේ අවම ධාවන දුර ප්‍රමාණයවත් ධාවනය නොකොට කිලෝ මීටර් 70,868 ක් ඌන උපයෝජනය කිරීම තුලින් දෙපාර්තමේන්තුවට රු.4,556,775 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා රට වසා තැබීම හා සීමිත දින ගණනක් පමණක් රාජකාරි කිරීම හේතුවෙන් මසකට ධාවනය කරන කි.මී.3000 ක් ධාවනය කිරීමට මෙම වසර 02 තුළදී නොහැකි විය. | වාහන අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතු අතර උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව වාහනය ධාවනයේ යෙදවීමට වගබලා ගත යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 541 ක් වුවත් තථ්‍ය කාර්ය මණ්ඩලය 412 ක් වූයෙන් තනතුරු 129 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 14 | සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති වීම, උසස් වීම් සඳහා පැවැත්වීමට තිබූ විභාග කල්යාම, ස්ථාන මාරුවීම් ලැබ නිලධාරීන් වෙනත් දෙපාර්තමේන්තු වෙත යාම හේතුවෙන් හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් බහුකාර්යය | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්ද තෘතියික හා ද්විතික මට්ටමේ තනතුරු 57 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 58 ක් ද පුරප්පාඩුව පැවතුණි. | යෝජනා ක්‍රමය යටතේ බඳවා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් පුරප්පාඩු වී ඇත. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටු කර ගැනීමට සෘජුවම අදාළ වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක්, ප්‍රධාන ඉංජිනේරු ඇතුළු ඉංජිනේරු තනතුරු 05 ක්, නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් ජල විද්‍යා මිනින්දෝරු තනතුරු 02 ක් වැනි ප්‍රධාන තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 න් එක තනතුරක සිටි නිලධාරියා අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්වීම් ලැබූ නිසා පුරප්පාඩු වී ඇති අතර, අනෙක් තනතුර පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඉංජිනේරු තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇති අතර ප්‍රමාණවත් නිලධාරීන් ලබා නොදීම හේතුවෙන් පුරප්පාඩු වී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |